# මාධ්‍ය නිවේදනය
## කාර්මික නිෂ්පාදන දර්ශකය
### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**දුරකථනය: 011-2147401** **ෆැක්ස්: 011-2147412** **2016 දෙසැම්බර් 16**

කර්මාන්ත අංශයේ වර්ධනය මැනීමට වඩාත් ම සුදුසු දර්ශකයක් ලෙස කාර්මික නිෂ්පාදන දර්ශකය හැඳින්විය හැකි අතර මෙම දර්ශකය මඟින් කර්මාන්ත අංශයේ නිෂ්පාදන ධාරිතාවෙහි කෙටි කාලීන වෙනස්වීම් හඳුනා ගත හැකිය. තව ද මෙමඟින් ආර්ථික සංවර්ධනයේ හැරවුම් ලක්ෂ්‍යා හඳුනා ගත හැකිය. ඒ අනුව මෙම දර්ශකය 2016 ඔක්තෝබර් මස සිට මාසිකව ගණනය කරනු ලබන අතර දින 45 ක කාල පරතරයකට පසුව දර්ශක අගයන් නිකුත් කරනු ලැබේ. 2015 පදනම් වර්ෂය ලෙස ගෙන ගණනය කරන ලද මෙම දර්ශකයෙහි අගයන් වෙනස් පදනම් වර්ෂ සහිත දර්ශක සමඟ සැසැඳිය නොහැක.

මෙම දෙපාර්තමේන්තුව මඟින් පැවැත්වූ 2015 වාර්ෂික කර්මාන්ත සමීක්ෂණයෙහි දත්ත දර්ශකයෙහි බරිත අගයන් ගණනය කිරීමට භාවිත කරන ලද අතර නිෂ්පාදන කර්මාන්ත අංශයෙහි එකතු කළ අගය පදනම් කරගෙන බරිත අගයන් ගණනය කරන ලදි. ඒ අනුව නිෂ්පාදන කර්මාන්ත අංශයට ආහාර නිෂ්පාදන අංශයෙන් ඉහළම දායකත්වය (35.2%) වාර්තා වූ අතර ඇඟලුම් නිෂ්පාදන (19.8%) සහ ලෝහ නොවන ඛණිජමය ද්‍රව්‍ය නිෂ්පාදනය (7.8%) පිළිවෙලින් දෙවන සහ තෙවන ස්ථාන ගෙන ඇත.

ඒ අනුව 2015 වර්ෂයේ සාමාන්‍ය මාසික නිෂ්පාදනයට සාපේක්ෂව, 2016 ඔක්තෝබර් මස නිෂ්පාදන කර්මාන්ත අංශයෙහි නිෂ්පාදන ධාරිතාවයෙහි 4.3% ක වැඩිවීමක් වාර්තා වේ. තව ද, 2015 සාමාන්‍ය මාසික නිෂ්පාදනයට සාපේක්ෂව 2016 ඔක්තෝබර් මස කඩදාසි සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන (23.0%) සහ ගෘහ භාණ්ඩ නිෂ්පාදන ( 21.5%) වල කැපී පෙනෙන වර්ධනයක් වාර්තා වේ. 2016 ඔක්තෝබර් මස ආහාර නිෂ්පාදන අංශයෙහි 0.5% ක වැඩිවීමක් වාර්තා වේ. 2015 වර්ෂයේ සාමාන්‍ය මාසික නිෂ්පාදනයට සාපේක්ෂව, දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදන (0.4%), අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන (2.0%) , විදුලි උපකරණ නිෂ්පාදන(3.5%) සහ රසායනික ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන (2.3%) වල අඩුවීමක් වාර්තා වේ. (මේ පිළිබඳව වැඩි විස්තර සඳහා අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න - www.statistics.gov.lk/Industries)

**කාර්මික නිෂ්පාදන දර්ශකය (2015=100)**

| වර්ෂය සහ මාසය | දර්ශක අගය |
|---|---|
| 2016 ඔක්තෝබර් | 104.3 |